# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1360 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 22/08/2024 පැය 1705

## මාධ්‍ය නිවේදනය

**මනුෂ්‍ය ඝාතනයක් සිදු කර සැකකරු සියදිවි නසා ගැනීම - නිවිතිගල පොලිස් වසම.**

2024.08.21 වන දින රාත්‍රී කාලයේ නිවිතිගල පොලිස් වසමේ දැල ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු තියුණු ආයුධයකින් පහර දී කාන්තාවක් ඝාතනය කර තවත් පුද්ගලයෙකුට බරපතල තුවාල සිදුකර ඇති බවට නිවිතිගල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 38 ක් වූ කලවාන පාර, දැල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකරු මරණකාරියගේ ස්වාමිපුරුෂයා වන අතර මොවුන් වයස අවුරුදු 18 ක පුත්‍රයා හා අවුරුදු 08 ක දියණිය සමඟ නිවසේ ජීවත්ව සිට ඇත. පවුල් ආරවුලක් හේතුවෙන් සැමියා විසින් තියුණු ආයුධයකින් බිරිඳට හා පුත්‍රයාට පහරදී ඇති අතර තුවාලකරුවන් රත්නපුර රෝහලට ඇතුලත් කිරීමේදී බිරිඳ මියගොස් ඇත. අනතුරුව නිවස පරීක්ෂා කිරීමේදී වයස අවුරුදු 48 ක් වන සැකකරුද නිවස තුළ ගෙල වැළලාගෙන සියදිවි නසා ගෙන ඇත.

මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නිවිතිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**